// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2105/43 - 2019 ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2019.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* එම්එන්/ඩීඑස්/එල්/ඩී1/ඒකිව්/ඩබ්පීපී/11.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය:* 4-3/2/2017/සීර්බී/248.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ(සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක එම්එන්/54 තුල්ලුකුදිඉරිප්පු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නඩුක්කුඩා ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක "එම්එන් 781" හි කැබලි අංක 01, 02 සහ 03 ලෙස දක්වෙන, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.2657 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කොටස;

**මූලික පිඹුරු අංක එම්එන් 781**

01. **කැබලි අංක 01, 02 සහ 03**

ඉඩමේ නම: ඩොක්ටතෝඩ්ඩම්, ඩොක්ටරෝඩායි; වර්තමාන ඉඩම් පරිහරණය: හිස් ඉඩම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සෙලාන් බිස්නස් (පුද්ගලික) සමාගම, අංක 10/18, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08; ප්‍රමාණය:හෙක්. 3.2657.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019.02.15 දින පූ.භා. 10.00 ට මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019.02.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ.සිවසම්පු,
ප්‍රාදේශීය ලේකම්,
මන්නාරම.

2019 ජනවාරි මස 07 වැනි දින,
මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 639

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29225 - 17 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.